# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1791/43 - 2013 ජනවාරි මස 04 වැනි සිකුරාදා - 2013.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරය)**

1. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත අනුව විශේෂයෙන් සඳහන් කරන ලද ව්‍යාපාර ආයතනයක් ලෙස වර්ගීකරණය කර ඇති සමාගමක ශ්‍රී ලංකා රුපියල් වලින් නියම කර ඇති ගෙවා නිදහස් කළහැකි වරණීය කොටස් අනුමත කළ රටක අරමුදල්වලට, අනුමත කළ ප්‍රාදේශීය අරමුදල්වලට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාපිත ආයතනවලට සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්ට (ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයන්ද ඇතුළත්ව) නිකුත් කිරීම සහ පැවරීම සඳහා (ලංකා නීති ප්‍රඥප්තිවල 423 වැනි අධිකාරය වූ) 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ (සංශෝධිත) සම්බන්ධයෙන් අදාළ විය යුතු 7, 10, 11, 15 සහ 30 (5) වගන්තිවල කාර්ය සඳහා මෙහි මින්මතු දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මෙයින් අවසරය ප්‍රදානය කරනු ලැබේ.

(i) වරණීය කොටසක කල් පිරීමේ කාලය නිකුත් කළ දිනයේ සිට වසර 3කට වඩා අඩු නොවිය යුතුය.

(ii) කොටස් ගෙවා නිදහස් කිරීම නිකුත් කළ දින සිට වසරක් ගතවීමට මත්තෙන් ආරම්භ නොකළයුතු අතර සෙසු කාලපරිච්ඡේදය පුරාවට සමානුපාතිකව බෙදා හැරිය යුතු ය.

(iii) එලෙස නිකුත් කළ කොටස් සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කළ හැකිනම්, එවන් පරිවර්තනය කිරීමක් ඕනෑම අවස්ථාවක සිදු කළ හැකි අතර 2002.04.19 දිනැති අංක 1232/14 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (සංශෝධිත) සඳහන් කර ඇති බැහැර කිරීම් සහ සීමා කිරීම්වලට අනුකූලව විය යුතු ය.

(iv) ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නාවූ සහ මේ යටතේ අවසර දෙනු ලැබූ ගණුදෙනුවක පාර්ශ්වකරුවකු වන්නා වූ තැනැත්තෙකු විසින්, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත වාසිකයකු බවට අදාළ පරිදි, කොටස් පැවරුම් ආකෘතිය මත හෝ කොටස් ඉල්ලුම් ආකෘතිය මත ප්‍රකාශනයක් කළ යුතු ය.

(v) මේ යටතේ අවසර දෙනු ලැබූ යම් නිකුතුවක හෝ ගණුදෙනුවක කොටස් සඳහා වූ ගෙවීම, තත්කාර්ය සඳහා විනිමය පාලකවරයා විසින් නිකුත් කරන ලද විධාන වලට අනුකූලව ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුමෙන් (SIA) හෝ ඒ ගිණුමට පමණක් කරනු ලැබිය යුතු ය.

(vi) මේ යටතේ අවසර දෙනු ලැබූ යම් ගණුදෙනුවක් සම්බන්ධයෙන් කොටස් විකිණීමෙන් ලත් මුදල්, ලාභාංශ සහ කොමිස් මුදල් වැනි ගෙවීම් සම්බන්ධයෙන් භාර කරනු ලැබූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, බලපත්‍රලත් කොටස් තැරැව්කරුවෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් ඉහත (v) ඡේදයෙහි සඳහන් සුරැකුම්පත් ආයෝජන ගිණුමට හෝ ඒ ගිණුමෙන් පමණක් එම ගෙවීම කළ යුතු ය.

1A - G 017109 — 355 (2013/01)

2. (අ) අනුමත කළ රටක අරමුදල්, අනුමත කළ ප්‍රාදේශීය අරමුදල්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ සංස්ථාපිත ආයතන මගින් සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන් 1. ඡේදයේ නියමයන් අනුව අත්පත් කරගත් ව්‍යාපාර කොටස් පැවරීම සඳහා 1. ඡේදයෙහි (iv), (v) සහ (vi) මගින් පනවනු ලැබූ කොන්දේසිවලට අනුකූලව විනිමය පාලන පනතේ 11 වන වගන්තිය යටතේ අවශ්‍ය අවසරයද,

(ආ) 1. ඡේදයෙහි (vi) මගින් පනවනු ලැබූ කොන්දේසි වලට අනුකූලව, මේ යටතේ අවසර දෙනු ලැබූ ගණුදෙනුවක් හා සම්බන්ධ කිසියම් ගෙවීමක් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකුට හෝ එවැනි පුද්ගලයෙකුගේ බැරට ගෙවීමට විනිමය පාලන පනතේ 7 වන වගන්තිය යටතේ අවශ්‍ය වන අවසරය ද,

මෙයින් ප්‍රදානය කරනු ලැබේ.

3. (අ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති සමාගමක් කෙරෙහි, එකී ගිවිසුම මගින් විනිමය පාලන පනතින් නිදහස් කිරීම් ප්‍රදානය කර ඇත්නම් එම නිදහස් කිරීමේ ප්‍රමාණයට ද,

(ආ) වෙනත් ලිඛිත නීතියක විධිවිධාන කෙරෙහි ද,

මේ නියමයෙහි ඇතුළත් කිසිවකින් යම් බලපෑමක් හෝ සම්බන්ධයක් ඇත්තේ යැයි තේරුම් නොගත යුතු ය.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
විනිමය පාලක.

2012 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ දී ය.

01 - 557

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.